16 වන පිටෙන්

කීවෙමි.
ඔහු හිස සලා එය අනුමත කළේය. 'ඔය වගේම ලස්සන වැඩක් මගේ නම නිසා මෑත කාලයේදීත් සිදු උනා. මට මතක හැටියට ඒ 1980 ගණන් වලදී. යම්කිසි කාර්යයක් සඳහා ප්‍රවෘත්ති පත්‍රයක සංස්කාරක වරයෙක් මා සමග මේ වගේම සාකච්ඡාවක් කළා. ඒ කාලයේ රටේ යම්කිසි ව්‍යාකූල තත්ත්වයක් තිබුණ නිසා, මගේ සාමාන්‍ය රාජකාරි වලට අමතරව, ආහාර බෙදාහැරීම පිලිබඳ වගකීමකුත් මට පැවරිලා තිබුණා.' පසුවදා ඒ සාකච්ඡාව පිලිබඳ පත්‍රයේ සඳහන් කර තිබුණා. ඒකේ මගේ නම දාලා තිබුණේ 'බ්‍රැඩ්මන් වීරකෝන්' වෙනුවට 'බ්‍රෙඩ්මන් වීරකෝන්' (Breadman) කියලා.'

'ඉතින් නමේ වෙනස ගැන, පත්තර කාරයි-න්ට පොඩි විහිළුවක් කරන්නට මට සිතුනා.'

පුවත්පත් කලාවේදියා විසින් ප්‍රමාද දෝෂයකින් කර ඇති වැරැද්දට මෙම රාජ්‍යතාන්ත්‍රිකයා කුමණ පියවරක් ගෙන ඇති දැයි දැන ගැනීමට මම විමසිලිමත් වීමි. 'මම ඒ තැනැත්තාට මා හමුවන ලෙස දුර කථන පණිවුඩයක් දුන්නා. ඔහු පැයකින් පමණ මා හමුවීමට පැමිණියා.' ඔහුට කථා කල මම 'මේ දවස්වල ආහාර පාලනයත් එක්ක පාන් බෙදා දීමත් මටම පැවරිලා තිබෙන නිසා, මගේ නම එයටම ගැලපෙන ලෙසටම විකෘති කර පත්‍රයේ දමා තිබීමට ස්තුති කරන්නයි මම ඔයාට කතා කළේ ' යයි කී විට, ඔහු මහත් පුදුමයට පත් උනා. මගේ නම 'බ්‍රැඩ්මන්' මිස 'බ්‍රෙඩ්මන්' නොවන බව කී විට ඔහු සියල්ල තේරුම් ගෙන, ප්‍රමාද දෝෂයකින්, මා 'පාන් කාරයා' (Breadman) ලෙස හැඳින්වීම ගැන මහත් අසීරුවකට පත් උනා.

'මෙම වැරද්දට සමා වන ලෙස ඔහු මගෙන් ඉල්ලා සිටියත්, එය අනවශ්‍ය බව තරයේම කියා සිටි මා, මෙය ගනන් නොගන්නා ලෙස ඔහු අස්වසා සිටියා. කොහොම වෙතත් ඒ දිනවල මට අමුතුවෙන් පැවරී තිබුණු ආහාර පාලන රාජකාරියේ කොටසක් වන ''පාන් බෙදීම'' සඳහා, එය හොඳින් ගැලපෙන අන්වර්ථ නාමයක් බව මම ඔහුට පැහැදිලිකර දුන්නා. 'Breadman' සහ 'Bradman' යන නාමපද දෙකෙහි එක් අක්ෂරයක වෙනස නිසා සිදුවී ඇති පටලැවිල්ල මම ඔහුට පැහැදිලි කර දුන් පසු ඔහු තරමක ලජ්ජාවකටද පත් උනා.'


බ්‍රැඩ්මන් වීරකෝන් මැතිතුමා

පුස්තකාලය විවෘත කිරීමේ උත්සවයට පැමිණි ආරාධිත අමුත්තන්, හේවිසි හොරණෑ සහිත පෙරහැරකින් ප්‍රධාන ශාලාව වෙත කැඳවාගෙන එන ලදී. චාම් ඇඳුමකින් සැරසී බස්තමක්ද රැගෙන පැමිණි ඔහු, පඩි කිහිපයක් නැග, වේදිකාවට ගොඩ වෙද්දී, අසල සිටි අයෙකු උදව් කිරීමට සැරසෙන විට විහිළුවක් කළ ඔහු, 'මට තවමත් තනියම පඩි නගින්නට පුළුවන්.

මේ බස්තම තියෙන්නේ මම වයසක කෙනෙක් කියලා පෙන්නන්නට විතරයි. මම මීට වඩා අමාරු 'පඩි' හත අටක්ම නැගලා තිබෙනවා. ඒ නිසා මම තවම සිතින් තරුණයි.' කියමින් සිනහ විය. මෙයද එතුමාගේ ඉතාමත් කාලෝචිත විහිලුවක් බව කවුරුත් තේරුම් ගත්හ.

ආරාධිත දේශක තුමාගෙන් ලබාගත් සියලු තොරතුරු සම්පිණ්ඩනය කර, හඳුන්වා දීමේ හේතු පාඨය / උපුටනය (citation) උත්සව සභාවේ කියවූ විට, බොහෝ දෙනෙකුට මහත් කුතුහලයක් ඇතිවිය. උත්සව සභාවේ රැස්ව සිටි බොහෝ අය, ඔහු කළුතර පයාගල ප්‍රදේශයට සම්බන්ධ කෙනෙකු බව නොදත්හ. ශාලාව ගිගුරුම් දුන් අත් පොළසන් නාදයකින් රැස්ව සිටි සියල්ලෝම එතුමා පිළිගත්හ.

හඳුන්වාදීමේ උපුටනය කියවන විට දේශක තුමා සවන් දෙයි. බ්‍රැඩ්මන් වීරකෝන් නමැති මේ යුග පුද්ගලයා, කළුතර හෝලි ක්‍රොස් විද්‍යාලයයේ මූලික අධ්‍යාපනය ලබා, ගුරුතලාවේ ශාන්ත තෝමස් විද්‍යාලයයේ ද්විතීය අධ්‍යාපනයෙන් පසු, පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුලත් වී තිබේ. විශ්ව විද්‍යාලයයෙන් ආර්ථික විද්‍යාව සහ සමාජ විද්‍යාව විෂයයන්ගෙන් ගෞරව උපාධියක් ලබා ඇති ඔහු 'ෆුල්බ්‍රයිට්' (Fulbright) ශිෂ්‍යත්වයක් ලබා ඇමෙරිකා එක්සත් ජනපදයේ, මිචිගන් විශ්ව විද්‍යාලයයෙන් සමාජ විද්‍යාව පිලිබඳ ශාස්ත්‍රපති (MA) උපාධියක් ලබා තිබේ.
1952 වසරේදී, ශ්‍රී ලංකා සිවිල් සේවයට බැඳුනු ඔහු, දිවයිනේ ප්‍රදේශ කිහිපයකම සේවය කර 1954 දී, සර් ජෝන් කොතලාවල අගමැති තුමාගේ ලේකම් වශයෙන් පත්වී, 2002 වසර දක්වාම, තේරී පත්වූ සියලුම අගමැතිවරුන් සහ ජනාධිපතිවරුන්ගේ ලේකම් වරයා වශයෙන් අද්විතීය සේවයක් කර තිබේ.
ඔහුගේ

'Rendering Unto Caesar( A Fascinating Story of One Man's Tenure under Nine Prime Ministers and Presidents of Sri Lanka'

නම් පොතෙහි රාජ්‍යනායකයින් ඉතා කිට්ටු-වෙන් ආශ්‍රය කළ කාලයේ සත්‍ය තොරතුරු, ඉතා රසවත් ලෙස පාඨකයා හමුවේ තබා ඇත. ඉහලම මට්ටමේ රාජ්‍යතාන්ත්‍රිකයෙකු විසින් තම අත්දැකීම් ඉතාමත් අව්‍යාජ ලෙස විවරණය කර ඇති මෙම පොතට ජාත්‍යන්තර පිළිගැනීමක්ද ලැබී ඇත. මෙම පොත **'අරලියගහ මැදුරේ ස්ඵන්දනය'** යන නමින් සිංහල භාෂාවට පරිවර්තනය කර තිබේ.

**එසේම *'Kalutara – An Odyssey'*** නම් පොතෙහි කළුතර ප්‍රදේශයේ යටගියාවත් විශේෂයෙන්ම ගම්බද ජනතාවගේ සමාජ, අධ්‍යාපන, ආර්ථික වැනි විවිධ අංශ වල සහභාගිත්වය සහ ප්‍රදේශයේ නවීන සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳවද අගනා විස්තරයක් කියවිය හැකිය.

බ්‍රැඩ්මන් වීරකෝන් නමැති ඒ නමගිය රාජ්‍යතාන්ත්‍රිකයා විසින් ලියන ලද එම පොත් පුතකාලයේ පාඨකයින්ගේ ප්‍රයෝජනය සඳහා තෑගී කරන ලදී.

රාජකාරිය දේවකාරියකටත් වඩා ඉහලින් සැලකූ මෙම අග්‍රගණයේ රාජ්‍යතාන්ත්‍රිකයා, රාජ්‍යකටයුතු වලදීත් සමාජ ආශ්‍රයේදීත් සමානාත්මතාව ඉහලින්ම අනුගමනය කළ පොළොවේ පය ගසා සිටි, අද්විතීය පුද්ගලයෙකු බවට ප්‍රසිද්ධියක් ලබා තිබේ.

